බුදුශීනය

නොහොත් බෝධිසත්ත්ව සංකල්පය

වනරතන ඛේමක හිමි

බුදු හීනය

(මෙය භික්ෂූන් වහන්සේ කෙනෙකු විසින් විශේෂයෙන්ම භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ලියන ලද්දකි.)

වනරතන ඛේමක හිමි

පළමු සංස්කරණය - 2022 (ජනවාරි)
දෙවන සංස්කරණය - 2023 (පෙබරවාරි)

නොමිලේ බෙදාහැරීම සඳහා පමණි.

(මෙහි එන කරුණු විකෘති කිරීමකට, වෙනස් කිරීමකට ලක් නොකරන්නේ නම් පමණක් මෙම පොත පිටපත් කිරීමට, මුද්‍රණය කිරීමට, බෙදාහැරීමට අවසර ඇත. සියළු වෙළද හිමිකම් ඇවිරිණි.)

> "මහණෙනි, දෙදෙනෙක් තථාගතයන් වහන්සේට අපහාස කරති. කවර දෙදෙනා ද? ද්වේශ සහගත දුෂ්ඨ පුද්ගලයා හෝ ධර්මය වැරදියට ගත් ශ්‍රද්ධාවන්තයා හෝ. මහණෙනි, මෙම දෙදෙනා තථාගතයන් වහන්සේට අපහාස කරති." - (අං. නි. 2.1.3.2)

බුදුන්වහන්සේ ජීවමාන කාලයේදී මිනිසුන් ධර්මය වෙත යොමුවූයේ බොහෝ සෙයින්ම ධර්මයේ ඇති සත්‍යතාවය දැක ධර්මය ගැන පැහැදීමෙන් වූ අතර ඔවුහු බොහෝවිට බුද්ධිමත් අය වූහ. නමුත් පසු කාලයේ බුදුදහම ජනතාව අතර වඩාත් ප්‍රචලිත වන්නට වූ කළ සාමාන්‍ය මිනිසුන්ගේ සිත් ගත්තේ ගැඹුරු ධර්ම කරුණු නොව තේරුම් ගැනීමට වඩාත් පහසු, කතන්දරමය ස්වරූපයක් ඇති ජාතක කතා ය. අශෝක යුගයේ ගල් කැටයම් වලත්, පසුකාලීන අජන්තා, වෙල්ලෝර ආදී ස්ථානවල ඇති බිතුසිතුවම් වලත් ප්‍රධාන මාතෘකා ජාතක කතා වීමෙන්ම මේ කරුණ ස්ඵුට වේ. අද ලංකාවේ විහාර සිතුවම් වලත් වැඩි ඉඩක් ලබා ගන්නේ ජාතක කතා ය. ජාතක කතා ජනප්‍රිය වීමත් සමග බෝධිසත්ත්ව සංකල්පය ද ජනප්‍රිය වීම අපේක්ෂා කළ යුතු දෙයකි. එහි ජනප්‍රියත්වයත් සමඟ තමුන්ටත් බෝධිසත්ත්වයෙකු වීමේ ආශාව කෙනකු තුළ නිතැතින්ම හටගනී. මෙසේ බෝධිසත්ත්ව චරිතයත්, බෝධිසත්ත්වයෙකු වීමත් ජනප්‍රිය වූ පසු ඊළඟට මතු වූ ගැටලුව වූයේ බෝධිසත්ත්වයෙකු වූ පසු කුමක් කළ යුතු ද යන්නයි. මෙහිදී නැවත වරක් ජාතක කතා අධ්‍යයනයට ලක් කෙරුණු අතර ඒවායෙන් ඉගැන්වෙන පාඩම් අනුව ඒවා නොයෙක් ආකාරයන්ට අනුව වර්ග කොට 'පාරමිතා' නම් වූ බුදුන්වහන්සේ කිසිවිටෙකත් දේශනා නොකළ නව අදහසක් මතු විය.

වර්ගීකරණය අනුව පිළිගත් පාරමිතා සංඛ්‍යාව පහක් හයක් හෝ දහයක් විය. ඇතැම් විට තවත් වර්ගීකරණ තිබිය හැකි නමුදු අද අපට දැනගත හැකි ලෙස පැරණි ග්‍රන්ථ වල ඇත්තේ මෙම තුන පමණි. ථෙරවාදී සම්ප්‍රදාය පාරමිතා දහයක් පිළිගත් අතර මහායාන සම්ප්‍රදායන් පාරමිතා හයක් පිළිගත්හ. මෙම නව බෝධිසත්ත්ව හා පාරමිතා ඉගැන්වීම් සමග ඒ ආශ්‍රිත සාහිත්‍යයක් ද බිහිවිය. ඉන් (අද ඉතිරිව ඇති ග්‍රන්ථ අතරින්) පළමු ග්‍රන්ථය නම් අෂ්ට-සහශ්‍රිකා-ප්‍රඥා-පාරමිතා සූත්‍රයයි. ක්‍රි.පූ. පළමු වන සියවසේ පමණ ලියැවෙන්නට ඇතැයි සිතන මෙම සූත්‍රය මඟින් ප්‍රඥා පාරමිතාව සඳහා වැඩිය යුතු යැයි කියන ප්‍රඥාවත්, ඊට වන්දනාමාන කිරීමෙන් ලැබෙන ආනිසංසත් ප්‍රකාශ කෙරේ. (අද ථේරවාදය තුළ ද ඥාන වන්දනාවක් බිහි වී ඇත). මෙම සූත්‍රයේ බලපෑමත් සමඟ බුදු බවම ලැබීම එකම අරමුණ කරගත් මහායාන සම්ප්‍රදාය ආරම්භ වන අතර ක්‍රි.ව. පළමුවන සියවසේ ලියවුනා යැයි සිතන සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයෙන් මහායානයට වඩා ස්ථාවර පදනමක් ලබා දෙන ලදී. බුද්ධත්වයට පත්වීම ම උසස් බවත්, එම නිසා එය අරමුණු කරගත් තම සම්ප්‍රදාය ශ්‍රේෂ්ඨ යානය හෙවත් මහායානය ලෙසට නම් කර ගත් ඔවුහු, බුදුන්වහන්සේගේ දේශනාව හා උපදේශය වූ අර්හත්වයට පත්වීම ආත්මාර්ථකාමී පහත් වැඩක් ලෙස නම් කෙරෙනු අතර, මෙම උපදේශය අඩංගු මුල් බුද්ධ දේශනා සුරැකි කොට රැකගත් ථේරවාදීන්ව පහත් යානය හෙවත් හීනයානය ලෙසට නම් කළහ. (අවාසනාවකට අද කාලයේ ඇතැම් ථේරවාදී මහතෙරුන් වහන්සේලා තමුන්ගේ නොදැනුවත්කම හා අනුවණකම නිසා එම කතාවම, එනම් බුදු වීම උසස් බවත් රහත් වීම පහත් දෙයක් බවත් පවසති). සද්ධර්මපුණ්ඩරිකයට අනුව අර්හත්වයට පත්වීමෙන් විමුක්තිය නොලැබෙන අතර එය දේශනා කළේ අනුවණ ජනතාව ධර්මයට යොමු කර ගැනීමේ උපාය මාර්ගයක් ලෙස පමණි බුද්ධත්වයට පත්වීමෙන් පමණක් විමුක්තිය ලැබේ. ඊටත් පසු කාලීනව රචනා වූ ලංකාවතාර සූත්‍රයෙන් ද මෙම අදහස ම ඉදිරිපත් කරන ලදී. ලංකාවේ අභයගිරිය, මහාවිහාරයෙන් වෙන් වීමත්, ඉන්පසුව ඔවුන් මහායාන අදහස් පිළිගැනීමත් සමග මහායානය ලංකාවේ ද පැතිරෙන්නට වු අතර අනුරාධපුර යුගයේ අවසන් භාගය වන විට එය ථේරවාදය ද ඉක්මවා ප්‍රබල තත්වයකට පත්විය. අනුරාධපුරය බිඳවැටීමත් සමග මහායානය ද අවසන් වූ අතර මහා පරාක්‍රමබාහු රජතුමා සිදුකල ශාසන ශෝධනය ද මීට ප්‍රබලව හේතුවන්නට ඇත. මහායානය නැති වී ගියත් එහි

සලකුණු නොමැකෙන ලෙස ථේරවාදය තුළත්, ජනසමාජය තුළත් ඉතිරි වුණි.[1] වර්තමානය වන විට බෝධිසත්ත්ව සංකල්පයත්, පාරමිතා පිරීමත් ථේරවාදයේ කොටසක් බවට පත් වී හමාරය. බෝධිසත්ත්ව සංකල්පය නොහොත් බුදුබව පැතීම දඹදෙණිය යුගය වන විට විලාසිතාවක් බවට පත් වූ අතර අද ද මෙම විලාසිතාව සංඝ සමාජය මෙන්ම ගිහි සමාජයේ ද දක්නට ඇත. බුදුබව පැතීම සංඝ සමාජයේ ජනප්‍රිය වීමට ප්‍රබල හේතුවක් වූයේ ප්‍රතිපත්ති නොපිරීමට, සියල්ල අතහැර නොදැමීමට, ඒ වෙනුවට එකතු කර ගැනීමට හා සුඛෝපභෝගී ජීවිතයක් ගත කිරීමට එය මනා නිදහසට කාරණයක් ලබා දීමයි. තමුන් වනගත වී බවුන් නොවඩා නවීන සුඛෝපභෝගී වාහනයක යමින් එමින් පින්කම් වල නියැළෙන්නේ තනියම නිවන් අවබෝධ කරගැනීමේ ආත්මාර්ථකාමී ක්‍රියාවට තමුන් අකැමති නිසාත්, ඒ වෙනුවට නොපෙනෙන අනාගතයක යම් කිසි දිනෙක බුදු වී, දායක කාරකාදී සියලු දෙනාටමත් නිවන් පෙන්වීමට තමුන් බලාපොරොත්තු වන නිසා බවත් ඔවුහු ප්‍රකාශ කරති. මෙයට රැවටෙන අනුවණ දායකයන් තමුන්ගේ මතු බුදු වන හාමුදුරුවන්ට වඩ වඩාත් සුඛෝපභෝගී දේ ලබා දෙන්නේ තමුන්ටත් ඔහුගේ ශාසනයේදී අනාථපිණ්ඩිකලා විශාඛාවලා වන්නට ලැබේ යැයි සිහින දකිමිනි. කෛරාටික කමට නොව තමුන්ගේ නොදැනුවත්කම නිසාම මෙම අදහසට නතු වූ අහිංසක (නමුත් අවාසනාවට අනුවණ වූ) භික්ෂූන් වහන්සේලා ද සිටිති.

බුදු බව පැතීම ගැන බුදුන් වහන්සේ දේශනා කර ඇත්තේ කුමක්ද? සූත්‍ර ධර්ම කියවන ඕනෑම කෙනෙකුට වැටහෙන කරුණක් වන්නේ බුදුන්වහන්සේ කිසිම තැනක කවමදාවත් “මහණෙනි, උඹලත් බුදුවෙයල්ලා” යැයි කියා නැති බවත් ඒ වෙනුවට පවසා ඇත්තේ “සංස්කාරයන් ක්ෂය වන සුළුය, එම නිසා අප්‍රමාදීව කටයුතු කරන්න” යන්න බවත් ය. ‘නිබ්බානසච්ඡිකරණත්ථාය’ (‘නිවන් අවබෝධ කර ගැනීම සඳහා’) යැයි කියා පැවිද්ද ඉල්ලන ඇතැම් පුද්ගලයන් ඉන්පසුව එම අදහසත්, ඉහත බුද්ධ ඔවදනත් කුණු බක්කියට විසිකොට බුදුන්වහන්සේ කිසිවිටෙකවත් කරන්න යැයි නොකියපු දෙයක් පසුපස දිව යෑම අපූරු තත්වයක් නොවේ ද? ඔවුන්

---

[1] මේ සම්බන්ධව කියවිය යුතු වටිනා පොතකි පූජ්‍ය මොරටුවේ සාසනරතන තෙරුන්ගේ ‘ලක්දිව මහායාන අදහස්’ නම් ග්‍රන්ථය

ව්‍යාංගයෙන් පවසන්නේ මහා කාරුණිකයන් වහන්සේ ‘මතු බුදුවී සංසාරයෙන් සතුන් ගොඩ දමන’ ලෙස නොකීමෙන් ඉතා අකාරුණික වී ඇති බවක් ද? අටුවා වලට අනුව බුදු වීමට කල්ප ගණනක් පෙරුම් පිරිය යුතුය. මහාමේරු පර්වතය වසර සියයකට වරක් දිව්‍ය සළුවකින් පිස දමන්නේ නම් මහාමේරු පර්වතය ගෙවී ගියත් කල්පය ගෙවී නොයන බව කියවේ. එය ඒතරම් දිගු ය. (සාමාන්‍ය ගල් කැටයක්, සාමාන්‍ය රෙදි කැබැල්ලකින් දිනපතා පිසදා එම ගල ගෙවා දැමීමට කොපමණ කලක් ගත වන්නේ දැයි සිතන්න). එය සදාකාලිකත්වය හා සමාන ය. මෙයින් කියැවෙන්නේ මෙම බුදුබව පතන්නන් සදාකාලිකව ම සංසාරයේ වැටෙන බව නොවේ ද? ඔවුන් පසුපස ගොස් එම ශාසනවල තනතුරු බලාපොරොත්තු වන්නන් ද ඒ අනුවම සදාකාලිකව ම සංසාරයට වැටෙනවා නොවේ ද? ගිය ආත්මයේ ඔබ තැබූ බලාපොරොත්තු හා අපේක්ෂා ඔබට මෙම ආත්මයේ දී මතක ද? එලෙස ම මෙම ආත්මයේ බුදුබව පතන්නන්ට ඊළඟ ආත්මයේදී එම පැතුම මතක් වේ යැයි කීමට ඇති වගකීම, සාක්ෂිය කුමක්ද? ඊළඟ ආත්මයේ ඔවුන් අන්‍යාගමික පවුලක ඉපදුනහොත් පල්ලි ගොස් තමා ගලවාගන්නා ලෙස දෙවියන් වහන්සේට කන්නලවු නොකරනු ඇත්ද? එවිට බුදුවීමට මොකද වන්නේ? තමුන්ට ලැබුණු මෙම වටිනා ක්ෂණ සම්පත්තිය ඔවුන් විසින් බොළඳ ලෙස නැති කරගත්තා නොවේ ද?

අංගුත්තර නිකාය 1.16.3.13 සූත්‍රයේදී බුදුන්වහන්සේ මෙසේ වදාරති, “මහණෙනි, යම්සේ ස්වල්ප මාත්‍ර වූද ගූථය දූර්ගන්ධ ද, එලෙසින්ම මහණෙනි, මම ස්වල්ප මාත්‍ර වුද පැවැත්මත් (භවයත්), අඩුම ගණනේ අසුරු සැනක් ගසන කාලයකවත්, අගය නොකරමි”. බුදුන්වහන්සේ මෙසේ වදාරත්දි උන්වහන්සේගේ අවවාදය අනුව හික්මිය යුතු භික්ෂූන් වහන්සේලා කල්ප ගණන් භවය පතන්නේ නම් ඔවුන් පතන්නේ කඳු ගණන් ගූථය නොවේද? බුදුන්වහන්සේ යාවකලාපි සූත්‍රයේ දී (සංයුක්ත නිකාය IV 1.19.11) මෙසේ වදාරති. “මහණෙනි, යම්සේ සිව්මංසලක යව මිටියක් දමන ලද්දේ වේද, ඉක්බිති කත් ලී අතින් ගත් මිනිසුන් සය දෙනෙකු පැමිණ එම කත් ලී වලින් එම යව මිටිය තලන්නේ නම්, කත් ලී හයෙන් තලනු ලැබූ එම යව මිටිය මැනවින් තලන ලද්දක් වන්නේය. ඉක්බිති කත් ලීයක් ගත් හත්වැනි

මිනිසෙක් පැමිණ එම යව මිටිය තලන්නේය. එලෙසින් සත්වෙනි කත් ලීයෙන් තලන ලද යව මිටිය ඉතා මැනවින් තලන ලද්දක් වන්නේය. එලෙසින්ම දහම් නොදත් පෘථග්ජනයා ප්‍රිය අප්‍රිය රූප විසින් ඇසෙහි තලනු ලැබේ. ප්‍රිය අප්‍රිය ශබ්ද විසින් කනෙහි තලනු ලැබේ. ප්‍රිය අප්‍රිය ගන්ධ විසින් නහයෙහි තලනු ලැබේ. ප්‍රිය අප්‍රිය රස විසින් දිවෙහි තලනු ලැබේ. ප්‍රිය අප්‍රිය ස්පර්ශ විසින් කයෙහි තලනු ලැබේ. ප්‍රිය අප්‍රිය සිතුවිලි විසින් සිතෙහි තලනු ලැබේ. ඉදින් මහණෙනි එම දහම් නොදත් පුහුදුනා නැවත ඉපදීමට සිතන්නේ නම්, යම් සේ යව මිටිය හත්වෙනි කත් ලීයෙන් තලනු ලැබුවා සේ, එම මෝස පුරුෂයා ද මැනවින්ම තලනු ලබනනෙක් වන්නේය". බුදුවදන එසේනම් යම් පුහුදුනෙක් (බොධිසත්ත්වයෝ අනිවාර්යෙන්ම පුහුදුන් අය වෙති. ආර්ය භාවයට පැමිණියේ නම් ආත්ම හතකට වඩා ජීවත් නොවන බැවින් කිසිසේත් බුදු වන්නේ නැත.) දහස් වාරයක් ඉපදීමට සිතන්නේනම් එම මෝස පුරුෂයා දහස් වාරයක් තලනු ලබන්නෙක් නොවන්නේ ද? කල්ප ගණනක කෝටි සිය වාරයක් ඉපදීමට සිතන්නේ නම් එම මෝස පුරුෂයා කෝටි සියවාරයක් තලනු ලබන්නෙක් නොවන්නේ ද? දන්නභූමි සූත්‍රයේදී (මජ්ඣිම නිකාය III 3.5) බුදුන් වහන්සේ මෙසේ වදාරති: "ස්ථවිර (හෝ මජ්ඣිම හෝ නවක) භික්ෂුවක් ආශ්‍රව ක්ෂය නොකොට මරණයට පත්වුවහොත්, ස්ථවිර (හෝ මජ්ඣිම හෝ නවක) භික්ෂුව නොදැමුණු මරණයකට පත් වූයේ යැයි සළකනු ලැබේ". මේ අනුව සියලු බුදුබව පතන්නන් නොදැමුණු මරණයකට පත් වීමට සිහින දකින්නන් නොවේ ද?

මෑත ඉතිහාසයේ තමුන් බුදුවන බව ප්‍රකාශ කළ එක් තෙරුන් වහන්සේ නමක් තම ස්වයංකථිත චරිතාපදානයේ දී තම භාවනාව ගැන සඳහන් කරමින් කියා ඇත්තේ 'උසස් බලාපොරොත්තු' ඇති නම් සඞ්ඛාරුපෙක්ඛා ඤානයෙන් එහාට විපස්සනාව නොවැඩෙන බවයි. ඒ මාර්ගඵල ලැබුණොත් බුදුවීමට නොහැකි වන නිසා ය. 'උසස් බලාපොරොත්තුව' බුදුවීම නම් පහත් බලාපොරොත්තුව කුමක්ද? නිවන් අවබෝධ කර ගැනීම නොවේ ද? මාර්ගඵල, අර්හත්වය ලැබීම නොවේ ද? ථේරවාදයේ ආරක්ෂකයන් ලෙස පෙනී සිටින මෙම තෙරුන් වහන්සේලා මේ ප්‍රකාශ කරන්නේ ඉහත මහායාන

සූත්‍ර වල ප්‍රකාශ වුනු දෙයම නොවේ ද?[2] ඔවුන් ආවඩන්නේ මහායානයටම නොවේ ද? පිරිහෙලන්නෙ බුද්ධ දේශනාව නොවේ ද? ඔවුන් බුදුන් වහන්සේ දුන් අවවාද පසෙකලා තමුන්ම බුදුවීමට සිතීමෙන් මෙම බුදුන්වහන්සේත්, උන් වහන්සේගේ ධර්මයත්, සංඝයාත් ප්‍රතික්ෂේප කර දමා නැති ද? මෙම බුදු බව පතන්නන් පිළිම ඉදිරියේ පැය ගණනක් ගාථා කියමින් වඳින්නේ කාටද? කලින් පැවසුවාක් මෙන් බුදුන් වහන්සේ අපට බුදු වීමට උපදෙස් දී නැත. ඒ වෙනුවට සංඝයාට උපදෙස් දී ඇත්තේ කවුරුන් මෙන් වන්නට ද? අංගුත්තර නිකාය 2.3.12.1 සූත්‍රයේදී බුදුන් වහන්සේ මෙසේ වදාරති: "මහණෙනි, ශ්‍රද්ධාවන්ත භික්ෂුව නිවැරදිව පතන්නේ 'සැරියුත්-මුගලන් යම් සේද, මම ද එලෙස වන්නෙමි'යි පැතිය යුතුය. මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන්ට තරාදිය එයයි, ප්‍රමාණය එයයි, එනම් සැරියුත්-මුගලන්ලා ය". බුදුබව පතන්නන් පිහිටුවා ගන්නේ බුදුන් වහන්සේ වදාළ මෙම නිවැරදි පැතුම ද? ඔවුහු භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය ඉක්මවා යන්නන් නොවේ ද?

තවත් කිව යුතු දෙයක් ඇත. කෙනෙකු සෝවාන්ඵලයට පැමිණෙන විට ධර්මය පිළිබඳ සැකය (විචිකිච්ඡා) නැතිව යයි, සම්‍යග්දෘෂ්ටිය පිහිටයි. සෝවාන් නොවුනු පෘතග්ජනයින් (බෝධිසත්ත්වයින් ද පෘතග්ජනයින් ය) පෘතග්ජනයින් වී සිටින්නේ සම්‍යග්දෘෂ්ඨිය නැති නිසාමය. මිත්‍යාදෘෂ්ඨියක එළඹ සිටින නිසාමය. වෙනත් වචන වලින් කිවහොත් බුදුබව පතන්නන්

---

[2] මෙම තෙරුන් වහන්සේම ඊට කලින් අවස්ථාවක, බුදු ගුණ භාවනාව වඩන්නේ නම් බුදුන් වහන්සේ පුද්ගලිකවම පැමිණ කමටහන් දෙන්නේ යැයි ධර්මානුකූල නොවන, ධර්මවිරෝධි ප්‍රකාශයක් ද කර තිබුණි. මෙම තෙරුන් වහන්සේලා සිතා සිටින්නේ බුදුන් වහන්සේ පිරිනිවන් පෑ පසු නිවන් ලෝකයට ගොස් තමුන්ගේ ගුණ සිහි කරන්නේ කවුදැයි කියා මේ ලෝකය දෙස බලා සිටින බවකි. මෙය ද මහායාන අදහසකි. බුදුවරු තමුන්ගේ බුද්ධක්ෂේත්‍ර වල සදාකාලිකව වැඩ වසන්නේ යැයි සුඛාවතීව්‍යූහ වැනි මහායාන සූත්‍ර වල සඳහන් වේ. මෙම තෙරුන් වහන්සේලා තමුන්ගේ නොදැනුවත්කම නිසාම "අපි ථේරවාදය රකින්නෙමු"යි කියා මහායානයට ම ආවඩන අයුරු අපූරු නොවේද? කෙතරම් නමුත් හොද්ද හැඳි ගෑවත් හැන්දට එහි රසය දැනෙන්නේ නැත. එලෙසින්ම අර්ථය නොදන්නේ නම් කෙතරම් සූත්‍ර කටපාඩම් වුවත් ඉන් ඇති ප්‍රයෝජනය කුමක්ද?

සිටින්නේ මිත්‍යාදෘෂ්ඨියකය. ඔවුන්ට සම්මාදිට්ඨිය පිහිටා නැත. ධර්මය පිළිබඳ සැක දුරු වී නැත. ඔවුන් බුදු බව පතන්නේ ඔවුන්ට සම්‍යග්දෘෂ්ඨිය නැති නිසාමය. ධර්මය ගැන සැක ඇති නිසාමය. මිථ්‍යාදෘෂ්ඨියක පිහිටා සිටින නිසාමය. යම් කිසි දවසක ඔවුන්ගේ එම සැක දුරු වී ගියහොත්, සම්‍යග්දෘෂ්ඨිය පිහිටිය හොත්, ඔවුන් බුදු බව පතන්නේද නැත. සෝවාන් ඵලයට ද පැමිණේ. එසේ නම් අප සවන් දිය යුත්තේ, විශ්වාස කළ යුත්තේ මිත්‍යාදෘෂ්ඨියක සිටින, ධර්මය පිළිබඳ සැක සංකා ඇති, කෙලෙස් බරිත බුදු බව පතන්නන් කියන දෙයට ද? නැතහොත් කෙලෙසුන් නැසූ, අවිද්‍යාව දුරලූ, සම්බුද්ධත්වයට පත් බුදුන් වහන්සේ කියන දෙයට ද? පිළිතුර ඔබටම පැහැදිලි ය.